## ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ
## නියාමන සේවා ගණයේ සුරාබදු නියාමක තනතුර සඳහා වන
## බඳවා ගැනීමේ පරිපාටිය

01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව: ශ්‍රී ලංකා සුරාබදු — යොමු අංකය: EB/109 /2000
දිනය: 2016.10.20

1.2 අමාත්‍යාංශය: මුදල් හා ජනමාධ්‍ය — යොමු අංකය: MF/1/22/COM/EXC
දිනය: 2016.11.22

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම — යොමු අංකය : DMS/C/04/02/21
දිනය : 2010.07.05

යොමු අංකය : DMS/C2/1175
දිනය : 2013.09.06
2014.03.13

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය — යොමු අංකය: EST-3/RECRU/02/2327
දිනය: 2013.04.08

යොමු අංකය: EST-2/04/REC/10102
දිනය: 2016.07.07

1.5 ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය — යොමු අංකය: NSCC/3/2/14/SR-1
දිනය: 2012.11.06
යොමු අංකය: NSCC/3/2/14/SR-2
දිනය: 2016.04.25

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය — යොමු අංකය: PSC/EST/03-01-02/07/2013
දිනය: 2017.01.03

පත් කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද සුරාබදු
[illegible] කොමසාරිස් ජනරාල්

**03.** සේවා ගණය පිළිබඳ විස්තර

3.1. සේවා ගණය : නියාමන සේවා ගණය

3.2. ශ්‍රේණි : සුරාබදු නියාමක/සුරාබදු කෝප්‍රල්, සුරාබදු සැරයන්

3.3.පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය:

පවරනු ලබන බලප්‍රදේශය තුළ ක්ෂේත්‍ර රාජකාරි කටයුතු කරමින් සුරාබදු දෙපාර්තමේන්තුවේ විෂය පථයට ගැනෙන සුරාබදු ආඥා පනත සහ අනෙකුත් අණපනත්, වස විෂ අබිං හා අන්තරායකාරී ඖෂධ ආඥා පනත, 1999 අංක 8 දරන දුම්කොළ බදු පනත, 2006 අංක 27 දරන දුම්කොල හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත යන අණපනත් යටතේ සුරා අපරාධවලට අදාළ තොරතුරු සොයා වාර්තා කිරීම. එවැනි වැටලීම්වලට සහාය වී අදාළ අධිකරණ කටයුතු වලට සහාය ලබාදීම. කාර්යාලයේ උප සේවා රාජකාරි ඇතුළු සුරා අපරාධ/කාර්මික වාර්තා ලේඛන යාවත්කාලීනව පවත්වා ගෙන යාම හා ඉදිරිපත් කිරීම සඳහා සහය වීම. නිෂ්පාදනාගාර, ස්කාගාර හා ගුදම් රාජකාරිවල නියලීම. රා එකතු කිරීම් මධ්‍යස්ථාන පරීක්ෂා කිරීම හා ග්‍රහණ කටයුතුවල යෙදීම.

3.4.කාර්යයන් පැවරීම:

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර, මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොටගෙන දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

**04.** තනතුරෙහි/තනතුරුවල ස්වභාවය: ස්ථිර විශ්‍රාම වැටුප් සහිත

**05.** වැටුප්

5.1. වැටුප් කේත අංකය :

- සුරාබදු නියාමක / සුරාබදු කෝප්‍රල් - RS-1-2016
- සුරාබදු සැරයන් - RS-2- 2016

5.2. වැටුප් පරිමාණය :

- සුරාබදු නියාමක / සුරාබදු කෝප්‍රල් - රු.29,540-7x300-27x370–41,630/-
- සුරාබදු සැරයන් - රු. 32010-9x370-17x495-43755/-

සුරාබදු නියාමක පුහුණුව සඳහා ප්‍රාථමික පත්වීම ලැබූ දින සිට අවම වශයෙන් මාස 06ක් වූ පුහුණුවන කාලය සඳහා පුහුණු දීමනාවක් ගෙවනු ලැබේ. (පුහුණු දීමනාව අදාළ බඳවා ගැනීම් සිදු කරන අවස්ථාවන් වලදී තීරණය කෙරෙනු ඇත.)

## 06. සේවා ගණයට අයත් තනතුර/තනතුරු

6.1. අනුමත තනතුරු නාම/ අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|
| සුරාබදු නියාමක/සුරාබදු කෝප්‍රල් | 600 | තොරතුරු /ඔත්තු ලබාගැනීම හා බලපත්‍ර ස්ථාන පරීක්ෂා කිරීමේ කටයුතුවලදී ඉහළ නිලධාරීන්ට අවශ්‍ය සහාය දීම හා කාර්යාලයේ උප සේවා රාජකාරි ඇතුළු සුරා අපරාධ/කාර්මික වාර්තා සම්බන්ධයෙන් උසස් නිලධාරීන් විසින් පවරන රාජකාරි |
| සුරාබදු සැරයන් | 100 | තොරතුරු /ඔත්තු ලබාගැනීම හා ග්‍රහණ කටයුතුවලදී ඉහළ නිලධාරීන්ට අවශ්‍ය සහාය දීම, කාර්යාලයේ උප සේවා රාජකාරි ඇතුළු සුරා අපරාධ/කාර්මික අපරාධ වාර්තා සම්බන්ධයෙන් උසස් නිලධාරීන්ට සහයවීම සහ උසාවි රාජකාරි |

6.2. ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

සුරාබදු නියාමක/කෝප්‍රල් : 600

සුරාබදු සැරයන් : 100

## 07. බඳවා ගැනීමේ ක්‍රමය

7.1. බඳවා ගන්නා ප්‍රතිශතයන් - සුරාබදු නියාමක

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 90% |
| සීමිත | 10% |
| කුසලතා | - |

සටහන:

සීමිත පදනම යටතේ පිරවීමට නියමිත තනතුරු ප්‍රමාණය ඒ යටතේ පිරවීමට නොහැකි වුවහොත් එම තනතුරුද බාහිර අයදුම්කරුවන්ගෙන් පුරවනු ලැබේ.

විවෘත ධාරාව යටතේ බඳවා ගන්නන්ගෙන් 10%ක් කාන්තා අයදුම්කරුවන් සඳහා වෙන් කෙරේ. (කළමනාකරන සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/C2/1175 හා 2014.03.13 දිනැති ලිපිය අනුව)

7.2. විවෘත බඳවාගැනීම :

7.2.1. බඳවාගන්නා ශ්‍රේණිය: සුරාබදු නියාමක

7.2.2. සුදුසුකම්:

7.2.2.1. අධ්‍යාපන සුදුසුකම්: සිංහල/දෙමළ භාෂාව හා ගණිතය යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාවද ඇතුළු විෂයයන් හයකින් එක් වරකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සමත්වීම.

7.2.2.2. වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

7.2.2.3 පළපුරුද්ද : අදාළ නොවේ.

7.2.2.4. කායික සුදුසුකම් : 1. පිරිමි අයදුම්කරුවන් සඳහා අවම වශයෙන් උස අඩි 05 අඟල් 06 ක් තිබිය යුතුය. පපුවේ වටප්‍රමාණය ආශ්වාස නොකොට අඟල් 33 ද, කාන්තා අයදුම්කාරිනියන් සඳහා උස අඩි 05 අඟල් 02 ද තිබිය යුතුය.

2. උපැස් යුවලක් හෝ ස්පර්ශ කණ්නාඩි (කන්ටැක් ලෙන්සස්) රහිතව භාණ්ඩ හැඳිනීමේ දෘෂ්ඨිය ඇතුළුව අවම වශයෙන් 6/6 හා 6/12කඇස් පෙනීමකින් යුක්ත විය යුතුය.

3. සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.2.2.5. වෙනත් : 1. අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

2. විශිෂ්ය චරිතයකින් යුක්ත විය යුතුය.

3. තනතුරට බඳවාගැනීමට අවශ්‍ය 7.2.2 හි සිට 7.2.3 දක්වා සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන්වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී තිබිය යුතුය.

7.2.3. වයස:

7.2.3.1. අවම සීමාව : අවුරුදු 18 යි.

7.2.3.2. උපරිම සීමාව : අවුරුදු 30 යි.

7.2.4. බඳවාගැනීමේ ක්‍රමය:

ලිඛිත විභාගය හා යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ. පළමුව ලිඛිත පරීක්ෂණය පවත්වන අතර ලිඛිත විභාගය සමත්වන අය අතුරින් බඳවාගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් තුන්ගුණයක් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ලිඛිත පරීක්ෂණයේ හා යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලබන ලකුණු වල එකතුවේ කුසලතා අනුපිළිවෙළින් බඳවා ගනු ලැබේ. එම අය සම්බන්ධයෙන් රහස්‍ය වාර්තා සහ ඔවුන්ට විරුද්ධව සුරා අපරාධ හා වෙනත් අපරාධ නොමැති බව සහ අධිකරණයෙන් දඬුවම් ලබා නොමැති බව තහවුරු කර ගැනීමෙන් අනතුරුව තෝරාගනු ලබන්නන් මාස හය (06) ක පුහුණුව සඳහා බඳවා ගනු ලබන අතර, ඉන් මාස තුන (03) ක් පුහුණු පාසලේ සහ ඉතිරි මාස තුන (03) ක්ෂේත්‍ර පුහුණුවක් වේ. එම පුහුණුව සාර්ථකව නිමකරනු ලබන්නන් සුරාබදු නියාමක තනතුරට බඳවා ගනු ලැබේ.

7.2.4.1 ලිඛිත විභාගය:

| විෂයයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| 2. සාමාන්‍ය දැනීම | පැය 01 | 100 | 40 |

(විෂය නිර්දේශය ඇමුණුම - 01)

7.2.4.1.1 පවත්වන බලධරයා: විභාග කොමසාරිස් ජනරාල්

7.2.4.2. වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය: අදාළ නොවේ

7.2.4.4 යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය:

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සළකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | අදාළ නොවේ |
| වෙනත් කුසලතා<br>• ක්‍රීඩා කුසලතා<br>• බාල දක්ෂ/ශිෂ්‍ය භට<br>• ආත්මාරක්ෂක සටන් ක්‍රම<br>• සමාජ සේවා කටයුතු වලට අදාළව දරු නිලතල<br>• රියදුරු බල පත්‍රයක් ලබා තිබීම | 45 | |
| පරිගණක හැකියාව | 15 | |
| භාෂා හැකියාව | 15 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාව | 05 | |
| එකතුව | 100 | |

සටහන

ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටිය අනුමතකිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ඇත.

7.2.4.4.1 : යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධාරියා : සුරාබදු කොමසාරිස් ජනරාල්

7.2.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ පළකිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වී
පළකිරීම හා වෙබ් අඩවියේ පළකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැ

7.3 .සීමිත බඳවාගැනීම

7.3.1. බඳවාගන්නා ශ්‍රේණිය: සුරාබදු නියාමක

7.3.2. සුදුසුකම්:

7.3.2.1. අධ්‍යාපන සුදුසුකම්: අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී සම්මාන සාමාර්ථ 2ක් සහිතව සිංහල/දෙමළ භාෂාව හා ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් හයකින් සමත්වීම.

7.3.2.2. වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

7.3.2.3 පළපුරුද්ද :

1. පත්වීම ස්ථිර කර තිබීම.
2. දෙපාර්තමේන්තුගත සුරාබදු රියදුරු හෝ බංගලා භාරකරු ස්ථිර තනතුරක යටත් පිරිසෙයින් වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.
3. තනතුරේ පූර්වාසන්න වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

7.3.2.4. කායික සුදුසුකම :

1. අවම වශයෙන් උස අඩි 05 අඟල් 04 ක් හා පපුවේ වටප්‍රමාණය ආශ්වාස නොකොට අඟල් 32 ක් විය යුතුය.
2. උපැස් යුවලක් හෝ ස්පර්ශ කණ්නාඩි (කන්ටැක් ලෙන්සස්) රහිතව භාණ්ඩ හැඳිනීමේ දෘෂ්ඨිය ඇතුලුව , අවම වශයෙන් 6/6 හා 6/12ක ඇස් පෙනීමකින් යුක්ත විය යුතුය.
3. සෑම අපේක්ෂකයකුම ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.3.2.5. වෙනත්

කනතුරට බඳවාගැනීමට අවශ්‍ය 7.3.2 හි සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන්වන දිනට සම්පූර්ණ වී තිබිය යුතු අතර විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

7.3.3 වයස: අදාළ නොවේ.

7.3.4 බඳවාගැනීමේ ක්‍රමය:

ලිඛිත විභාගය හා යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ. පළමුව ලිඛිත පරීක්ෂණය පවත්වන අතර ලිඛිත විභාගය සමත්වන අය අතුරින් බඳවාගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් තුන්ගුණයක් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ලිඛිත පරීක්ෂණයේ හා යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලබන ලකුණු වල එකතුවේ කුසලතා අනුපිළිවෙලින් බඳවා ගනු ලැබේ.එසේ තෝරා ගනු ලබන්නන් මාස තුනක පුහුණුව සඳහා බඳවා ගනු ලබන අතර, පුහුණුව සාර්ථකව නිමකරනු ලබන්නන් සුරාබදු නියාමක තනතුරට බඳවා ගනු ලැබේ.

7.3.4.1 ලිඛිත විභාගය:

| විෂයයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. සාමාන්‍ය දැනීම | පැය 02 | 100 | 40 |

( විෂය නිර්දේශය ඇමුණුම - 02)

7.3.4.1.1 පවත්වන බලධරයා : සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

7.3.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාල නොවේ.

7.3.4.4 යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය:

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සළකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම්<br>• අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සඳහා විෂයයන් 04 කට සම්මාන සමාර්ථ ලබා තිබීම (ලකුණු 08)<br>• අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය සමත්වීම (ලකුණු 02) | 10 | අදාළ නොවේ |
| අතිරේක පළපුරුද්ද<br>ජ්‍යෙෂ්ඨතාව සඳහා පළමු වසර 05න් පසු වසරකට ලකුණු 05 බැගින් | 30 | |
| වෙනත් කුසලතා<br>• ක්‍රීඩා කුසලතා<br>• බාල දක්ෂ/ශිෂ්‍ය භට | 25 | |

| | | |
|---|---|---|
| • ආත්මාරක්ෂක සටන් ක්‍රම<br>• සමාජ සේවා කටයුතු වලට අදාළව දැරූ තිලකල<br>• රියදුරු බලපත්‍රයක් ලබා තිබීම | | |
| පරිගණක හැකියාව | 15 | |
| භාෂා හැකියාව | 15 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | 05 | |
| එකතුව | 100 | |

සටහන:

ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකු... ප්‍රමාණයන් ඇතුළත, යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපා... අනුමත කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ඇත.

7.3.4.4.1 : යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ

මණ්ඩලය පත්කරන බලධාරියා : සුරාබදු කොමසාරිස් ජනරාල්

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය: අභ්‍යන්තර දැන්වීම් පළකිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ... කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම: අදාළ නොවේ

08. කාර්යක්ෂමතා කඩඉම්

8.1.

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉ... ස්වභාවය ලිඛිත පරීක්ෂණය/වෘ... පරීක්ෂණය/සහති... පාඨමාලාව/වෙනත්... |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | සුරාබදු නියාමක තනතුරට බඳවාගෙන වසර 03 ක් ගත වීමට පෙර | ලිඛිත හා වාචික පරීක්ෂ... ඇමුණුම- 03 |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | සුරාබදු නියාමක තනතුරට බඳවාගෙන වසර 10 ක් හෝ සුරාබදු සැරයන් තනතුරට උසස්වී වසර 03ක් හෝ යන දෙකින් පළමුව යෙදෙන කාල සීමාව තුළ | ලිඛිත පරීක්ෂණය ඇමුණුම- 04 |

8.2. කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද:

වසරකට දෙවරක්

8.3. කාර්යක්ෂමතා කඩඉම් වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද:

1 වන හා 2 වන කාර්යක්ෂමතා කඩඉම් - සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

**09. භාෂා ප්‍රවීණතාව:**

**9.1.**

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| 01. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැදුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළදී ලබාගත යුතුය. |
| 02. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාව ලබාගත යුතුය. |

**10. ශ්‍රේණි උසස් කිරීම**

10.1. සුරාබදු නියාමක තනතුරේ සිට සුරාබදු කෝප්‍රල් තනතුර දක්වා උසස් කිරීම

10.1.1 සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව:

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

1. සුරාබදු නියාමක තනතුරෙහි පත්වීම ස්ථිර කර තිබීම.
2. සුරාබදු නියාමක/නියාමකවරියක් ලෙස අවම වශයෙන් වසර පහක (05) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක පහක් (05) උපයාගෙන තිබීම.
3. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර පහ (05) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
4. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
5. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම.
6. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.
7. කොළ පැහැති යහපත් කල් ක්‍රියා ලාංජනයක් ලබා තිබිය යුතුය

10.1.2 උසස් කිරීමේ ක්‍රමය: අයදුම්පත් කැඳවන දිනට ඉහත 10.1.1 යටතේ ඇති සියලුම සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් සුරාබද්දු කොමසාරිස් ජනරාල් විසින් පත් කරන පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින් ජ්‍යෙෂ්ඨතාවයේ අනුපිළිවෙල මත සුරාබද්දු කෝප්‍රල් තනතුරට උසස් කෙරේ. සුරාබද්දු කෝප්‍රල් තනතුරට උසස් කිරීම මත වැටුපෙහි කිසිදු වෙනසක් සිදු නොවේ.

10.1.3 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය: දෙපාර්තමේන්තුවේ දැන්වීමක් පළකිරීම, අභ්‍යන්තර චක්‍රලේඛයක් පළකිරීම හා වෙබ් අඩවියේ පළ කිරීම මගින්.

10.2. සුරාබද්දු කෝප්‍රල් තනතුරේ සිට සුරාබද්දු සැරයන් තනතුර දක්වා උසස් කිරීම

උසස් කිරීමේ අනුපාතය - සුරාබද්දු සැරයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| සීමිත තරග විභාගය මගින් | 60% |
| සේවා පළපුරුද්ද හා කුසලතාවය මත | 40% |

10.2.1. සේවා පළපුරුද්ද හා කුසලතාවය මත උසස්කිරීම

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම්:

1. සුරාබද්දු කෝප්‍රල් තනතුරෙහි ස්ථිර කර තිබීම
2. සුරාබද්දු කෝප්‍රල් තනතුරෙහි වසර පහ (05) ක සේවා කාලයක් ඇතුළුව අවම වශයෙන් වසර අට (08 ) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම
3. අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම
4. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම
5. අවම වශයෙන් යහපත් කල්ක්‍රියා ලාංඡන දෙකක් (02) ලබා තිබීම
6. දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්ව තිබීම
7. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය: අයදුම්පත් කැඳවන දිනට ඉහත 10.2.1.1 යටතේ ඇති සියලුම සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් මුළු ලකුණු වල කුසලතාවයේ අනුපිළිවෙළ මත හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව සුරාබදු සැරයන් තනතුරට උසස් කරනු ලැබේ.

10.2.1.2.2. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| සේවා පළපුරුද්ද<br>(සුදුසුකම් ලැබීමට වූ අවම සේවා කාලය හැර දෙපාර්තමේන්තුවේ සුරාබදු කෝප්‍රල්වරයකු වශයෙන් සේවය කර ඇති සෑම වසරකටම ලකුණු 05ක් ද නියාමකවරයකු වශයෙන් සේවය කර ඇති සෑම වසරකටම ලකුණු 03ක් ද බැගින් ) | 40 | අදාල නොවේ |
| කාර්ය සාධන ඇගයීම් ( පසුගිය වසර 05 සඳහා )<br>➢ අති විශේෂ 03 -<br>➢ සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ 02 -<br>➢ සතුටුදායක 01 - | 15 | |
| ලබා ඇති සාධු සටහන්<br>➢ විශේෂ සාධු සටහන් සඳහා - 02<br>➢ සාමාන්‍ය සාධු සටහන් සඳහා - 01 | 20 | |
| රන්වන් ලාංජනය ලබා තිබේ නම් | 05 | |
| අදාළ ක්ෂේත්‍රයේ පුහුණුව සඳහා<br>➢ ඩිප්ලෝමාවක් සඳහා - 05<br>➢ සති 02 කට වැඩි පුහුණුවක් සඳහා - 02<br>➢ දෙපාර්තමේන්තුවේ පුහුණු වැඩසටහනක් සඳහා - 02<br>(අදාල ක්ෂේත්‍රයේ පුහුණුව හැදෑරීමෙන් අනතුරුව ඉන් ලබා ඇති සහතික පත් අනුව මෙම ලකුණු ලබා දෙනු ඇත) | 10 | |
| සම්මුඛ පරීක්ෂණය සඳහා<br>(ප්‍රායෝගික හැකියාව හා උසාවි රාජකාරි පිළිබඳ) | 10 | |
| එකතුව | **100** | |

සටහන

ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටිය අනුමතකිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ඇත.

10.2.1.2.3 : යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : සුරාබදු කොමසාරිස් ජනරාල්

10.2.1.3. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය: අදාළ සියලුම සේවා ස්ථාන ආවරණය වන පරිදි දැන්වීමක් පළ කිරීම, අභ්‍යන්තර චක්‍රලේඛයක් නිකුත් කිරීම සහ වෙබ් අඩවියේ පළකිරීම මගින්

10.2.2. සීමිත තරඟ විභාගය මත උසස්කිරීම

10.2.2.1. සපුරාලිය යුතු සුදුසුකම්:

1. සුරාබදු නියාමක/කෝප්‍රල් තනතුරේ ස්ථිර කර තිබීම
2. සුරාබදු නියාමක/කෝප්‍රල් තනතුරෙහි අවම වශයෙන් වසර අට (08) ක සක්‍රීය සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම
3. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම
4. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම
5. අවම වශයෙන් යහපත් කල්ක්‍රියා ලාංඡන දෙකක්(02) ලබා තිබීම
6. දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්ව තිබීම
7. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම

10.2.2.2. උසස් කිරීමේ ක්‍රමය:

අයදුම්පත් කැඳවීමේ දිනට ඉහත 10.2.2.1 යටතේ ඇති සියලුම සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් ලිඛිත විභාගයක හා යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. පළමුව ලිඛිත පරීක්ෂණය පවත්වන අතර ලිඛිත විභාගය සමත් වන අය අතරින් උසස් කිරීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් තුන් ගුණයක් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ලිඛිත පරීක්ෂණයේ හා යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙළ මත හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව සුරාබදු සැරයන් තනතුරට උසස් කරනු ලැබේ.

10.2.2.2.1. ලිඛිත විභාගය :

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. සුරාබදු නීතිය හා දෙපාර්තමේන්තු නියෝග (ඉහළ මට්ටම) | 100 | 40% |
| 2. පොදු ප්‍රශ්ණ පත්‍රය | 100 | 40% |

(විෂය නිර්දේශය ඇමුණුම - 05)

10.2.2.2.1.1. විභාගය පවත්වන බලධරයා: සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක්

10.2.2.2.2. වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ

10.2.2.2.3. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය:

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| සේවා පළපුරුද්ද | 20 | අදාළ නොවේ |
| කාර්යසාධන ඇගයීම | 20 | |
| ලබා ඇති සාධු සටහන් පූර්වාසන්න වසර 05 තුළ විශේෂ සාධු සටහන් සඳහා-05, සාමාන්‍ය සාධු සටහන් සඳහා-03) | 30 | |
| ලාංජන ලබා තිබේ නම් (පලාවන් 3-ලකුණු 01, රතු 1- ලකුණු 02, රතු 2- ලකුණු 03, රතු 3- ලකුණු 04, රන්වන්-ලකුණු 05) | 05 | |
| තනතුරට අදාල පුහුණුවීම් | 10 | |
| උසස් අධ්‍යාපන සුදුසුකම් (ඩිප්ලෝමා-ලකුණු 05, පැය 60ට වැඩි සහතික පත්‍ර පාඨමාලා-ලකුණු-03) | 05 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | 10 | |
| එකතුව | **100** | |

සටහන

ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටිය අනුමත කිරීම පත් කිරීමේ බලධරයා විසින් සිදු කරනු ඇත.

10.2.2.2.3.1 : යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : සුරාබදු කොමසාරිස් ජනරාල්

10.2.2.2.4. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

10.2.3 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය: අදාළ සියලුම සේවා ස්ථාන ආවරණය වන පරිදි දැන්වීමක් පළකිරීම, අභ්‍යන්තර චක්‍රලේඛයක් පළකිරීම හා වෙබ් අඩවියේ පළ කිරීම මගින්

11.තනතුරු වලට පත් කිරීම: අදාළ නොවේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නාවූ කොන්දේසි:

සුරාබදු සැරයන් තනතුරට උසස්වීම් නොලැබුවේ වුවද කාර්යක්ෂමතා කඩඉම් හා අනෙකුත් අවශ්‍යතා සම්පූර්ණ කිරීම මත සුරාබදු නියාමක/කෝප්‍රල් තනතුරු සඳහා වැටුප් පරිමාණයේ උසස් නොවී නම් ලැබෙන වැටුප තීරුවෙහි වැටුප් වර්ධක ලබා ගැනීමට හැකිවේ.

13.රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපනවලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපන:

"සක්‍රිය සේවා කාලය" යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුළත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රිය සේවා කාලයක් ලෙස සැළකිය යුතුයැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ද ඇතුළත්, නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ.

14.ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය:

බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ නියුතු වූවන් නව බඳවා ගැනීමේ පරිපාටිය අනුව අන්තර්ග්‍රහණය කරන ක්‍රමවේදය ඇමුණුම 06 හි දැක්වේ.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීති වල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

16. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

17. අන්තර්කාලීන විධිවිධාන -2017.12.31 දක්වා ක්‍රියාත්මක වේ.

(1) නව බඳවා ගැනීම් පරිපාටිය අනුව සුරාබදු සැරයන් තනතුරට පළමුවර සිදු කරනු ලබන උසස්වීම් අවස්ථාව සඳහා පමණක් සීමිත ධාරාව හා කුසලතා ධාරාව යටතේ පහත නිලධාරීන් සුදුසුකම් ලබයි.

i. සේවා පළපුරුද්ද හා කුසලතාව මත සුරාබදු සැරයන් තනතුරට උසස් කිරීමේ 10.2.1.1.හි අංක 1 හා 2 හි වන සුදුසුකම් නොසලකා සුරාබදු නියාමක / සුරාබදු කෝප්‍රල් තනතුරෙහි ස්ථිර කර ඇති අවම වශයෙන් වසර 10ක සේවා කාලය සම්පූර්ණ කර ඇති 10.2.1.1 හි අනෙකුත් සුදුසුකම් සපුරා ඇති නිලධාරියකු වීම

ii. සීමිත තරග විභාගය අනුව සුරාබදු සැරයන් තනතුරට උසස් කිරීමේදී 10.2.2.1 හි අංක 2 හි දක්වා ඇති සුදුසුකම් නොසලකා සුරාබදු නියාමක / සුරාබදු කෝප්‍රල් තනතුරෙහි වසර 8ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති 10.2.2.1 හි අනෙකුත් සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්

සකස් කළේ : අත්සන................................

පරීක්ෂා කළේ : අත්සන................................

(විෂය භාර මාණ්ඩලික නිලධාරියා)

නිර්දේශ කර ඉදිරිපත් කරමි

අත්සන:................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ඒ.බෝදරගම

තනතුර : සුරාබදු කොමසාරිස් ජනරාල්

දිනය: 2017.08.16

නිලමුද්‍රාව : ඒ. බෝදරගම සුරාබදු කොමසාරිස් ජනරාල් (වැ.බ.) ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව අංක: 353, පරණ කෝට්ටේ පාර, රාජගිරිය.

යොමු අංකය: MF1/22/Com/EXC

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවෙ හි සුරාබදු නියාමක තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය හා සුරාබදු කෝප්‍රල් හා සැරයන් තනතුරු වලට උසස් කිරීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන................................

නම................................

Ms. G. D. C. Ekanayake ලේකම්
Deputy Secretary to the Treasury
....Ministry of Finance.................... අමාත්‍යාංශය
Colombo 01

දිනය: 2017.08.30

නිල මුද්‍රාව................................

යොමු අංකය: PSC/EST/03-01-02/07/2013

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවෙ හි සුරාබදු නියාමක තනතුරු සඳහා වන බඳවාගැනීමේ පරිපාටිය හා සුරාබදු කෝප්‍රල් හා සැරයන් තනතුරු වලට උසස් කිරීමේ පරිපාටිය ..2017.01.03... දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදි.

අත්සන................................

නම.. එච්. එම්. ගාමිණී සෙනෙවිරත්න

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය: 2017.10.03

නිල මුද්‍රාව..එච්. එම්. ගාමිණී සෙනෙවිරත්න... ලේකම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.